# ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා නියුක්තිය,ආර්ථික වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම

**එස්. යු. මුතුමාල**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සමස්ත සේවා නියුක්ති මූලයන් ලෙස රාජ්‍ය අංශයේ සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින්, සේව්‍යයන්, ස්වයං රැකියාවන්හි නියුතු වුවන්, ගෙවීමක් නොලද පවුලේ සේවකයින් ලෙස ප්‍රභේදනය වී ඇත. මේ අතරින් මෙහිදී අවධානය යොමු කෙරෙනුයේ රාජ්‍ය සේවා නියුක්තිය ආර්ථික වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑමයි . ජාත්‍යන්තර ශ්‍රම ආයතනය දක්වන ප්‍රකාර ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ 1933 ජාතික ගිණුම් ක්‍රමවේදය අනුව රාජ්‍ය අංශය යනු මධ්‍යම රජයත්, සියලුම ප්‍රාදේශිය හා පළාත් පාලන ආයතනත් එම ආයතන වලට අයත් සමාජ ආරක්ෂණ අරමුදල් හා රජයේ ඒකකයන් මගින් පාලනය වන වෙළඳපොළ හා ලාභ අරමුණු කර නොගත් ආයතනයනුත්ය. ඒ අනුව, අප රටේ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය යන්නට මධ්‍යම රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන හා රජයට අයත් ව්‍යාපාර ආයතන වල සේවය කරන සියලුම සේවා නියුක්තිකයන් අයත් වේ. මෙම සේවා නියුක්තිකයන්ට ආරක්ෂක සේවය ද ඇතුලත්ව කර්මාන්ත හා සේවා යන අංශ ද්විත්වයේම ආර්ථික කාර්යයන්හි නියැලී සිටින අතර එමගින් රටේ දළ දේශිය නිෂ්පාදිතය (ද.දේ.නි) සඳහා තම දායකත්වය සපයයි. ඒ අනුව මෙම රාජ්‍ය සේවා නියුක්තිය කෙතරම් දුරට ආර්ථිකයට බලපෑම් කර ඇත්ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ඒ අනුව 2013 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ වාර්තාවන් ද්විතීයික දත්ත ලෙස භාවිත කර ඒවා වගු, වට ප්‍රස්තාර, තීරු ප්‍රස්තාර හා රේඛීය සටහන් මගින් ඉදිරිපත් කර ඇත. දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ගත් විට සමස්ත රාජ්‍ය අංශයෙහි 2014/2013 ප්‍රතිශත වෙනස 4.3% ක් වු අතර 2015/2014 එය 1.5% ක් පෙන්නුම් කරයි. එසේම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 දී රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා පහළ ගොස් ඇති බව පෙනේ. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ සමීක්ෂණයට අනුව 2015 වසරේ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය යන අංශ දෙකෙහිම සේවක සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මෙලෙස මෙම අධ්‍යයනය රාජ්‍ය සේවා නියුක්තිය, ආර්ථික වර්ධනය කෙරෙහි ඇතිකරන බලපෑම පිළිබඳ අධ්‍යනය කරනු ලැබේ.

**මුඛ්‍ය පද :** ආර්ථික වර්ධනය, සේවා නියුක්තිය, රාජ්‍ය සේවා නියුක්තිය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, shashikaushani@gmail.com